සමාජ ජාල අඩවි පෙරහන් වී තිබේ. ජාතිවාදී අදහස් පැතිරවීමට සන්නිවේදනය බාධකයක් ඇති කිරීමට රජය සමත් වී සිටී. නමුත් ජාතිවාදී සිතුවිලි අවසන්ද? මුලිනුපුටා ඇත්ද? නැත. එය තවමත් මා වැනියවුන්ගේ සිත් තුළ ය. ජාතිවාදය යනු කළහකාරී සිදුවීම් හෝ ආවේගශීලී/ද්වේශසහගත ප්‍රකාශයන් හෝ භීතිය සහ සැකය මුසුකරගත් කටකතාවන් පමණක් ම නොවේ. ජාතිවාදය සදාකාලයට ම බලපැවැත්වෙන පරිදි තුරන් කිරීමට නම් එතරම් ආන්තික ස්වරූපයකින් තොර ව වුව ද මතුවන අධිපතිවාදී චින්තනයේ ලකුණුද ජාතිවාදී ගැටීම්වල ප්‍රාථමික මූලබීජයන් ලෙස වටහා ගත යුතු ම ය. භූමිතෙල් තුළ ගිල්වන ලද සෝඩියම් කැබලි සේ එය ම ' සිත රජයන කළ සමාජ ජාල පෙරහන්කරණය හෝ නීතිය ක්‍රියාත්මක කිරීම මාධ්‍ය සංදර්ශන පමණක් වනු ඇත.

කලින් කල මතුවන වර්ග සංහාරයන් යනු සිංහල-බෞද්ධ මහජාතිකවාදයේ ක්‍රියාකාරී දෘෂ්‍ය ස්වරූපය පමණි. එහි අක්මුල් ඇත්තේ අප ඉතිහාස කතිකාව තුළ ය. බුදුන් සිය දහම සුරකෙන රට හෙළදිව බව දැන එය ජනාවාස කරන විජය ඇතුළු පිරිස සුරකින්නට සක්දෙවුට කී බව කියන පුරාවෘත්තයේ ය. දුටුගැමුණු රජු මරාදැමුවේ මිනිසුන් එකහමාරක් බව පමණක් කියන චින්තනය තුළ ය. මහාවංශයේ 17 ගාථාවෙන් කියැවෙන්නේ ශත්‍රු මර්දනය කරන ගුණයෙන් යුතු බුදුරජාණන්වහන්සේ සිය දහම සුරකෙන්නේ එහි බැවින් ලංකාව සිංහලයන්ට උරුම කරදෙනු පිණිස එහි සිටි යකුන් ගිරි නම් දිවයිනට පළවාහැරි බවකි. ශ්‍රී ලංකාව යනු සහෝදර ජනවර්ගයන්ට නැති අයිතියක් සිංහලයන්ට ඇති රටක් බවට වන අදහස සමාජගතකිරීම සහ තහවුරුකිරීම සිදුකරන්නේ මෙම පුරාවෘත්තය; සම්භව මිත්‍යාව තුළිනි. ජාතිවාදයට දෙවන ආශිර්වාදය පිරිනමන්නේ එළාර-දුටුගැමුණු පුවතෙහි එන දුටුගැමුණු රජු තමන් අතින් සිදු වූ මහා සංහාරය ගැන පසුතැවිලි වන විට එවක සිටි රහතුන් ඇතුළු භික්ෂූන් රජුගේ සිත සනසවනු පිණිස දුටුගැමුණු රජු විසින් මරාදැමුවේ මිනිසුන් එකහමාරක් පමණක් යැයි පැවසූ අපූරු තර්කය තුළිනි. ජයන්ත චන්ද්‍රසිරිගේ මහරජ ගැමුණු සිනමා කෘතියෙහි එන දුටුගැමුණුද සංග්‍රාමයට සැරසුණු සිය සේනාවට මෙසේ පවසයි. ධර්මය සුරක්ෂිත වීමට නම් ධර්මය පවතින රාජ්‍යය සුරක්ෂිත විය යුතු ය. ඒ අනුව බුදුදහම අවිහිංසාවාදී ධර්මයක් වුවද එය සුරක්ෂිත කරගැනීමේ අරමුණින් මිනීමැරීම පාපයක් නොවේ.

බුදුදහම ආධ්‍යාත්මික පාරිශුද්ධියක් අරමුණු කරගනිමින් බිහිවුණු තවුස් දහමක් බැවින් (අඩු තරමින් මෙය එහි මුල් අවධිය සම්බන්ධයෙන්වත් සත්‍යයකි) එය ලෞකික ජීවිතයට ආදේශ කරගැනීමේ දී උභතෝකෝටිකයකට මුහුණ දෙන්නට වෙයි. බුදුදහමේ විමුක්ති මාවත තෘෂ්ණාව නිරුද්ධ කිරීමට යෝජනා කරන මුත් ගිහිජීවිතයේ සංතුෂ්ටියත්, ජයග්‍රහණත් රඳා පවතින්නේ ඒ මත ය. එ මෙන් ම එහි කිරීමට අකැප අකුසල් ලෙස දක්වන ප්‍රාණඝාතය ආහාරය පිණිස නොකර සිටීම පහසු වුවත් විද්‍යා පර්යේෂණවලදීද රාජ්‍ය ආරක්ෂාව තුළ දීද එය නොකර සිටීම අත්දුෂ්කර ක්‍රියාවකි. මේ අභියෝගය ජයගනු ලැබුවේ ඉහත කී චින්තනය තුළිනි. ව්‍යවහාරික ජීවිතය තුළ නිදහසේ හැසිරීමට බෞද්ධයන්ට හැකි බව කීමෙනි. පෙන්වාදීමෙනි. ඇතැම් විටක එනම් රාජ්‍යපාලකයෙකු මරණ දණ්ඩනය නියම කිරීම, යුද්ධයේ දී විරුද්ධවාදියෙකු ඝාතනය කිරීම බෞද්ධයෙකුට වරදක් නොවන බව, අවසාන විග්‍රහයේ දී එය සමාජ සුරක්ෂිතතාවයට හේතුවන බව කීමෙනි. ජාතියේ ආගමේ නාමයෙන් සිදුකරන ත්‍රස්ත ක්‍රියාවන් සාධාරණීකරණය කරගැනීමට මා වැනි වංක බෞද්ධයන් අද යොදාගනිමින් සිටින්නේ බුදදහම සාධාරණ ජීවිතයට වහලක් කරගනු පිණිස බිහිවුණු එම තර්කයයි.

හරියටම ෆේස්බුක් අඩවිය තාවකාලික ව වාරණය කිරීමට කලින් දවසේ මා එහි සැරිසරන විට මගේ ඇතැම් (ඔවුන් කිසිවෙක් නරක මිනිසුන් යැයි මම නොකියමි) සගයන් විසින් බෙදාගෙන තිබුණු පළකිරීම් දකින විට මට සිතුණේ ලංකාව සිංහලයන්ට /බෞද්ධයන්ට අයිති රටක් බවත් එහි අධිපති බලයක් ඔවුන්ට තිබිය යුතු බවත් කීමට ඔවුන් මෙහෙයවනු ලබන්නේ බුදුන් සිය දහම සුරකෙන රට හෙළදිව බව දැන එය ජනාවාස කරන විජය ඇතුළු පිරිස සුරකින්නට සක්දෙවුට කී බව කියන පුරාවෘත්තයෙන් බව ය.

දැන් ඔබ මෙසේ කියන්නට ඉඩ තිබේ. ඉතිහාස කතාවලින් මේවට පිටුබලයක් ලැබෙනවා වෙන්න පුලුවන්, ඒත් බොරුවට ඕව ගැන කෙස්පැලෙන තර්ක ඉදිරිපත් කරා කියල තමන්ට පොරක් වෙන්න පුලුවන් වෙයි. හැබැයි ඔය තියරිවලින් ඒවට ගොදුරුවෙච්ච අසරණ මිනිස්සුන්ට යහපතක් වෙන්නැනෙ. ප්‍රිය සොයුරිය, මා මේ සටහන තැබුවේ බුද්ධියට ය. හදවතට අමතන තිරශ්චීනත්වය එදිරි සඬ්ජායනා වෙන ම කළ යුතු ය. නමුත් ස්ථිර විසඳුමක් උදෙසා නම් අප පවතින ඉතිහාසය නිර්දේශයන් වෙනස් කළ යුතු ය.

අනගාරික ධර්මපාල, හෙන්රි පේද්‍රිස්, දුෂ්ඨගාමිණී වැනි මහජාතිකවාදයට සුජාතභාවය දීමට යොදාගත හැකි සුරුවම් දරුවන් අබියස වන්දනය නොකළ යුතු ය.